# පොළොන්නරුව සෙවනපිටිය දුම්රිය ස්ථානය ඉදිරිපිට වෙසෙන අහිකුණ්ඨික ජනයාගේ ජන ජීවිතය

කේ. එම්. ඒ. එස්. කුමාර

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
anilsureshkumarnew@gmail.com

---

ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ සිට මෙරට සංක්‍රමණ වූ ජන කොටසක් ලෙස විශ්වාස කරන අහිකුණ්ඨික ජනයා හැඳින්වීම සඳහා නයි නටවන්නා, නයි පනික්කියා වැනි පද භාවිත වේ. ශ්‍රී ලංකාවේ උතුරුමැද, නැගෙනහිර සහ සබරගමුව පළාත්වල කලාවැව, තීරුක්කෝවිල්, නාච්චාදූව, කැකිරාව, විජිතපුර, කුඩාගම, මඩකලපුව හා ගල්ගමුව වැනි ප්‍රදේශවල මෙම ජන කණ්ඩායම් සුලභව දැකිය හැකි ය.

පර්යේෂණයට බඳුන් කළ පොළොන්නරුව සෙවනපිටිය දුම්රිය ස්ථානය ඉදිරිපිට අහිකුණ්ඨික පවුල් 13ක් ජීවත් වේ. මෙහි සිංහල පවුල් 03 ක් සහ දෙමළ හා තෙළිඟු මිශ්‍ර පවුල් ජීවත් වන අතර සම්පූර්ණ ජනගහණය 71 කි. වසර පහළොවක් පුරා සෙවනපිටියෙහි ජීවත් වුව ද මොවුන් ස්ථිර පදිංචිකරුවෝ නොවෙති. මෙම ස්ථානයේ වෙසෙන අහිකුණ්ඨික ජනයාගේ සමාජ, ආර්ථික තොරතුරු දැනගැනීම සහ අහිකුණ්ඨික ජනයාගේ ඇදහිලි, විශ්වාස හා භාෂාව පිළිබඳව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ. කශේත්‍ර ගවේෂණ, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ ක්‍රමය මෙන් ම ලිඛිත මුලාශ්‍රය පරිශීලනයෙන් දත්ත ඒකරාශී කරගැනීම මෙහිදී සිදු කරනු ලැබිණි.

මෙම සමාජය දෙස බැලීමේදී අපිරිසිඳු බව, අපිළිවෙල හා නොහික්මුණු බව මොවුන්ගේ හැසිරීම් රටා අතර ප්‍රධාන වන බව පෙනේ. නිවාස සෑදීම, මංගල්‍ය හා අවමංගල්‍ය උත්සව, වැඩිවිය පැමිණීම හා විවිධ නිතිරීති මොවුන්ට ආවේණික වූ ලක්ෂණ අනුව නිර්මාණ වී ඇත. මෙහි ළමුන් කිහිප දෙනෙකු පාසල් යාමට පෙළඹී සිටිය ද වර්තමානය වන විට කිසිදු ළමයෙක් පාසල් කරා නොයයි.

අතීතයේ පටන් සිදුකරගෙන ආ ජීවනෝපායන් අතර සාස්තර කීම ගැහුණුන් ද නයි නැටවීම හා රිලා නැටවීම පිරිමින් ද සිඟාකෑම කුඩා ළමුන් හා වැඩිහිටියන් ද සිදු කරයි. එක් දිනකදී සොයා ගන්නා සියලු මුදල් වියදම් කරයි. ධීවර හා කෘෂිකාර්මික කටයුතුවල ද මොවුන් නිරත වන අතර, ගඩොල් කැපීම හා පොත් විකිණීම ආදි රැකියාවන් ද සිදු කරයි. අලුත් නුවර දැඩිමුණ්ඩ දෙවියන් මොවුන්ගේ ඇදහිලි හා විශ්වාස අතර ප්‍රමුඛ වේ. මෙම සියලු ලක්ෂණයන්ට අනුව ක්‍රමයෙන් මොවුන් සංස්කෘතික වෙනස්වීමකට ලක්වන බව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද : අහිකුණ්ඨිකයන්, මානවවංශ විද්‍යාව, සමාජ පරිණාමය